# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**7 ශ්‍රේණිය**

## වර්ෂ අවසාන ඇගයීම - 2018

## ගණිතය

කාලය : පැය 02

### I කොටස

**සැලකිය යුතුයි :**

- ❖ **අංක 01 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- ❖ **එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමි වේ.**


---

01. සුළු කරන්න. $3 \times 5 - 4$

02. හිස්තැන සඳහා සුදුසු අගය ලියන්න. $(+3) + (......) = (-1)$

03. දින 265 මාස හා දිනවලින් දක්වන්න.

04. නිවැරදි වචනය යටින් ඉරක් අඳින්න.
"පොතක පිටකවරයක මුල්ලේ දාර දෙකක් අතර කෝණය (ස්ථිතික / ගතික) ස්වභාවයක් ගනී."





05. අගය සොයන්න. $38.3 \div 100$

06. $3\frac{2}{5}$ විෂම භාගයක් ලෙස දක්වන්න.

07. විසඳන්න. $7a = 56$

08. ඔරලෝසු මුහුණතක කටු අතර මිනිත්තු 5ක කාලයකදී දැක්වෙන කෝණය $30^{0}$ක් නම්,
    (i) රූපයේ දක්වා ඇති කෝණයේ අගය අංශක කීයද?
    (ii) එම කෝණය කුමන වර්ගයේ කෝණයක් ද?





09. 23 475 හි ඉලක්කම් දර්ශකය සොයන්න.

10. චලිතගේ උපන් දිනය 2013.09.07 වන දා ය. ඔහුගේ සොයුරිය ඔහුට වඩා අවුරුදු 02 මාස 06 දින 03කින් වයසින් අඩු ය. ඇයගේ උපන් දිනය කවදා ද?


11. 0.28 යන දශම සංඛ්‍යාව,
    (i) භාගයක් ලෙස ලියන්න.
    (ii) ඉහත පිළිතුර සරල ම ආකාරයෙන් දක්වන්න.

12. රූපයේ දැක්වෙන O කේන්ද්‍රය වූ වෘත්තයේ,
    (i) අරයක් නම් කරන්න.
    (ii) OP = 4 cm නම් AB රේඛාවේ දිග සොයන්න.



13. අප අවට පරිසරයේ සමාන්තර දාර දැකිය හැකි අවස්ථා 2ක් ලියන්න.

14. ඔයිලර් සම්බන්ධය යොදා ගනිමින්, මුහුණත් හා ශීර්ෂ සංඛ්‍යාව සමාන වූ ද, දාර 8ක් ඇති ඝන වස්තුවක මුහුණත් සංඛ්‍යාව ලියන්න.




15. දී ඇති භාජනයේ $120\ m\ell$ ක දියර ප්‍රමාණයක් අඩංගු වේ. සම්පූර්ණ භාජනයේ පරිමාව නිමානය කරන්න.


16. රසකැවිලි වර්ගයක් නිෂ්පාදනයේ දී යොදන බටර් හා සීනි ස්කන්ධ අතර අනුපාතය 3 : 2කි. යෙදූ බටර් ප්‍රමාණය 480 g නම් මිශ්‍ර කරන ලද සීනි ප්‍රමාණය කොපමණද?

17. කසුන් රු. $x$ බැගින් පොත් 3ක් ද, රු. $y$ බැගින් පෑන් 4ක් ද මිලට ගන්නා ලදී. පොත් හා පෑන් සඳහා ඔහු ගෙවූ මුදල දැක්වීමට වීජීය ප්‍රකාශනයක් ලියන්න.

18. රූපයේ දැක්වෙන ටෙසලාකරණය කුමන වර්ගයට අයත් ද?



19. A නම් කුලකය වෙන් රූප සටහනක දක්වා ඇත. අවයව සඟල වරහන තුළ ලිවීමෙන් A කුලකය නැවත ලියන්න.





20. පරිමාණය 1 : 500 දක්වා ඇති සිතියමක 3.5 cm කින් දක්වා ඇති දිගට අදාළ සැබෑ දිග මීටර කීයද?

## II කොටස

❖ **පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

❖ **පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද, ඉතිරි ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් ද හිමි වේ.**

01. ඔබ පන්ති කාමරයේ දී "සරල රේඛීය තල රූප" පාඩම සඳහා කරන ලද ක්‍රියාකාරකම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(a) දී ඇති තල රූප සියල්ල බහු අස්‍ර ලෙස හඳුන්වයි.

(i) බහු අස්‍රයක් යනු කුමක්දැයි පහදන්න.

(ii) එම බහු අස්‍ර ප්‍රධාන කාණ්ඩ 2කට වෙන් කළ හැක. ඒවා මොනවාද?

(iii) ඉහත දී ඇති බහු අස්‍ර එම කාණ්ඩවලට වෙන් කරන්න. (ඉංග්‍රීසි අක්ෂර යොදා ගනිමින්)

(b) (i) සවිධි බහු අස්‍රයක ලක්ෂණ මොනවාද?

(ii) ඉහත දී ඇති රූපවල දැක්වෙන බහු අස්‍ර අතරින් සවිධි බහු අස්‍ර මොනවාද?

(iii) ඉහත දැක්වෙන රූප අතරින් පාද සමාන නමුත් සවිධි බහු අස්‍ර නොවන රූප මොනවාද?


02. (a) (i) 56 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියන්න.

(ii) 18, 12 යන සංඛ්‍යා යුගලයෙහි මහා පොදු සාධකය සොයන්න.

(b) (i) 3, 4, 8 යන සංඛ්‍යාවල කුඩා පොදු ගුණාකාරය සොයන්න.

(ii) ගොවියෙකු තමා සතු ඉඩමකින් වර්ග කිලෝමීටර $\frac{2}{3}$ ක මිරිස් ද, වර්ග කිලෝමීටර $\frac{3}{8}$ බටු ද, වර්ග කිලෝමීටර $\frac{1}{4}$ ක තක්කාලි ද වගා කර ඇත. ඔහු වගාවන් සඳහා යොදාගෙන ඇති මුළු බිම් ප්‍රමාණය වර්ග කිලෝමීටර කීයද?

03. විශාල ඉඩමක් රූපයේ දැක්වෙන ප්‍රමාණයේ බිම් කොටස් 15කට වෙන් කර ඇත.





(i) රූපයේ පරිමිතිය කොපමණද?

(ii) රූපයේ වර්ගඵලය සොයන්න.

(iii) කොටස් 15කින් සමන්විත විශාල ඉඩමේ වර්ගඵලය සොයන්න.

(iv) බෙදන ලද ඉඩම පවතින්නේ පහත ආකාරයට නම් මෙම ඉඩමේ පරිමිතිය සොයන්න.



04. (i) $x$ හා y අක්ෂ 0 සිට +6 තෙක් විහිදෙන කාටීසිය තලයක් ඇඳින්න.

(ii) ඉහත කාටීසිය තල මත පහත දී ඇති ලක්ෂ්‍ය ලකුණු කරන්න.
A(0, 2), B(1, 6), C(3, 4), D(5, 6), E(6, 2), F(3, 0)

(iii) සංවෘත රූපයක් ලැබෙන සේ ඉහත ලක්ෂ්‍ය සරල රේඛා ඛණ්ඩවලින් පිළිවෙළින් යා කරන්න.

(iv) ඔබට ලැබුණු රූපයේ සමමිතික අක්ෂය අඳින්න.

(v) එම සමමිතික අක්ෂය මත පිහිටි ඕනෑම ලක්ෂ්‍යයක $x$ ඛණ්ඩාංකය එක ම අගයක් ගනී. එම අගය කීයද?

05. එක්තරා බැංකු ශාඛාවක වසරේ මුල් මාස 6 තුළ අලුතින් ආරම්භ කරන ලද ගිණුම් සංඛ්‍යා පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| මාසය | ගිණුම් සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 40 |
| පෙබරවාරි | 55 |
| මාර්තු | 70 |
| අප්‍රේල් | 25 |
| මැයි | 40 |
| ජූනි | 60 |

(i) ඉහත තොරතුරු තීර ප්‍රස්තාරයක දක්වන්න.

♦ පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) ගිණුම් වැඩි ප්‍රමාණයක් ආරම්භ කර ඇත්තේ කුමන මාසයේ ද?

(iii) ගිණුම් එක සමාන ප්‍රමාණයක් ආරම්භ කර ඇත්තේ කුමන මාසවල දී ද?

(iv) වසරේ මුල් මාස 3 තුළ දී ආරම්භ කළ ගිණුම් සංඛ්‍යාව කොපමණද?

(v) වසරේ මුල් මාස 3 තුළ ආරම්භ කළ ගිණුම් සංඛ්‍යාව හා මැයි, ජූනි මාසවල ආරම්භ කළ ගිණුම් සංඛ්‍යාව අතර වෙනස කොපමණද?

(vi) අප්‍රේල් මාසය තුළ අඩු ම ගිණුම් ප්‍රමාණයක් ආරම්භ කිරීම කෙරෙහි බලපාන ලදැයි සිතිය හැකි හේතුවක් ලියන්න.

06. රයිනි තමා බැලීමට නිවසට එන යෙහෙළියන් පිරිසකට සංග්‍රහ කිරීම සඳහා පලතුරු යුෂ $\frac{1}{2}\ \ell$ ක් හා ජලය $1.5\ \ell$ ක් මිශ්‍ර කර පලතුරු යුෂ පානයක් සෑදුවා ය.

(i) සෑදූ මුළු බීම ප්‍රමාණය ලීටර කීයද?

(ii) එම ප්‍රමාණය මිලි ලීටරවලින් දක්වන්න.

(iii) වීදුරුවක ධාරිතාව $125\ m\ell$ නම්, සූදානම් කරගත් බීම වීදුරු ප්‍රමාණය කොපමණද?

(iv) පැමිණි යෙහෙළියන් දෙදෙනකුට සංග්‍රහ කිරීමට පිළියෙළ කළ වීදුරු ගණන ප්‍රමාණවත් නොවී නම්, පැමිණි යෙහෙළියන් ගණන කොපමණද?

07. (a) (i) “පාවහන් මිල 60% දක්වා අඩු කළා.” මෙහි දක්වා ඇත්තේ එක්තරා වෙළෙඳ පොළක් ඉදිරිපිට තිබූ දැන්වීමකින් උපුටා ගන්නා ලද කොටසකි. එහි දැක්වෙන ප්‍රතිශතය වචනයෙන් ලියන්න.

(ii) 75% භාගයක් ලෙස සරල ම ආකාරයෙන් දක්වන්න.

(b) කණ්ඩායම් ක්‍රියාකාරකමක දී A කණ්ඩායම ලකුණු $\frac{17}{20}$ ක් ද, B කණ්ඩායම ලකුණු $\frac{24}{30}$ ක් ද ලබා ඇත.

(i) A කණ්ඩායම ලබාගත් ලකුණු ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

(ii) B කණ්ඩායම ලබාගත් ලකුණු ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

(iii) A හා B කණ්ඩායම් අතරින් වැඩි දක්ෂතාවයක් දක්වා ඇත්තේ කුමන කණ්ඩායම ද?